www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

10 ශ්‍රේණිය | නර්තනය | කාලය පැය - 1/2

## 07 - බෙර වාදය

- **සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

01) රබන් නැටුමේ සුවිශේෂ ලක්‍ෂණයන් වන්නේ ........................................ අතැතිව නර්තනය කිරීමයි.

02) පංචතූර්ය වාද්‍ය භාණ්ඩවලින් තම්මැට්ටම අයත් වන්නේ ................................... කොටසට ය.

03) උත්සව ආරම්භයේ දී ........................................ වාදනය කිරීම සුභ කටයුත්තකි.

- **ප්‍රශ්න අංක 04 සිට 19 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

04) උඩරට සම්ප්‍රදායට අයත් දෙවන බෙර සරඹය කුමක්ද?
1) තකට තකට 2) තකට කුදට
3) තකට කුද කුදට 4) තකට ජිකට

05) උඩරට නර්තන සම්ප්‍රදායේ පමණක් භාවිත වන වාද්‍ය භාණ්ඩ ඇතුළත් පිළිතුර කුමක්ද?
1) ගැටබෙරය, තාලම්පට, පොකුරු බෙරය 2) ගැටබෙරය, උඩැක්කිය, පන්තේරුව
3) පොකුරුබෙරය, ඝෝෂක බෙරය, උඩැක්කිය 4) තම්මැට්ටම, උඩැක්කිය, හොරණෑව

06) මේවා ගැටබෙරයේ කොටස් වේ,
1) බෙර කඳ, බෙර පුහුල, ඉල්ලම් 2) ඉල්ලම්, තන්වර, වරපට
3) කැපුම් හම, සුරත්තට්ටුව, හයිතට්ටුව 4) වෙනිවර කැරැල්ල, කැපුම්හම, වරපට

07) දවුල ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කරන නර්ථන සම්ප්‍රදාය කුමක්ද?
1) උඩරට 2) පහතරට 3) සබරගම 4) භරත

08) සුසිර වර්ගයට අයත් වාද්‍ය භාණ්ඩ වන්නේ,
1) හොරණෑව, බටනලාව 2) හොරණෑව, පන්තේරුව
3) පන්තේරුව, රබු 4) හොරණෑව, ගෙජ්ජි

09) උඩරට නර්තන සම්ප්‍රදායට සුවිශේෂ වූ වාදන අංගයකි,
1) මඟුල් බෙර 2) හේවිසි 3) අත්‍යා බෙර 4) මළ බෙර

10) උඩරට සහ සබරගමු සම්ප්‍රදායට අයත් සතර බීජාක්ෂර වන්නේ මොනවාද?
1) ගත්, දිත්, ජිත්, නං 2) තත්, ජිත්, තොං, නං
3) තත්, දික්, තොං, නං 4) තක. ජිත්, තොං, නං



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

11) ''අවනද්ධ වාද්‍ය භාණ්ඩ'' යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?
   1) සම් වර්ග බැඳි මුහුණතක් සහිතව තාල වාදනය සඳහා නිපදවා ඇති භාණ්ඩයි.
   2) සාම්ප්‍රදායික භාණ්ඩ වෙනුවට ආදේශ කර ගත හැකි විකල්ප භාණ්ඩයි.
   3) අපතේ යන අමුද්‍රව්‍යවලින් පහසුවෙන් සකස් කර ගත හැකි භාණ්ඩයි.
   4) පංචතූර්ය වාදනයට යොදා ගන්නා භාණ්ඩයි.

12) තාල තැබීමේදී භාවිත කරනු ලබන වාද්‍ය භාණ්ඩය කුමක්ද?
   1) දඬු බෙරය 2) දවුල 3) උඩැක්කිය 4) තාලම්පට

13) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩය කුමක්ද?
   1) බන්ඩි බෙරය 2) සොෂක බෙරය
   3) පනා බෙරය 4) දෑත හරි බෙරය

14) විකල්ප වාද්‍ය භාණ්ඩයක් වන්නේ මින් කුමක්ද?
   1) තලිය 2) පන්තේරුව 3) පොකුරු බෙරය 4) දඬු බෙරය

15) බෙර වාදනයට පෙර සහ පසු බෙරයට නමස්කාර කිරීම,
   1) රීතියකි 2) සාම්ප්‍රදායික ලක්ෂණයකි
   3) සාරධර්මයකි 4) සම්මුතියකි

16) බෙර සරඹ අභ්‍යාසයට පිවිසෙන ආධුනිකයා ප්‍රථමයෙන්ම කළ යුතු වන්නේ,
   1) මූලික බීජාක්ෂර සතර වාදනය කිරීමයි.
   2) නමස්කාර පදය වාදනය කරන ආකාරය ඉගෙනුමයි.
   3) අංගුලියා පදය වාදනයට ඉගෙනුමයි.
   4) බෙරයේ වම සහ දකුණ නිවැරදිව හඳුනා ගැනීමයි.

17) මහ රබන් වාදනයේ දී ශිල්පීන් තම දක්ෂතා ප්‍රදර්ශනය කරනු ලබන්නේ,
   1) ඒක වාදනයෙනි 2) සමූහ වාදනයෙනි
   3) වාදනයට අනුව රන්තනයේ යෙදීමෙනි 4) අත්මාරු පද වාදනය කිරීමෙනි

18) බෙරයෙන් උපදින අක්ෂර හඳුන්වනු ලබන්නේ කුමන නමින්ද?
   1) බීජාක්ෂර 2) ගර්භාක්ෂර 3) අනුගර්භාක්ෂර 4) අවනද්ධාක්ෂර

19) තත්, තොං යන අක්ෂර උත්පාදනය කරනුයේ බෙරයෙහි,
   1) දකුණු ඇසෙනි 2) මේ ඇසෙනි
   3) දකුණු හා වම් ඇසෙනි 4) වම් හා දකුණු ඇසෙනි

- **කෙටි පිළිතුරු සපයන්න.**

20) බෙරයෙන් ඉපදෙන බීජාක්ෂර ගණන කොපමණ ද?

21) ගැටබෙරයෙන් හා දවුලෙන් ඉපදෙන සතර බීජාක්ෂර නම් කරන්න.

22) පහතරට බෙරයෙන් ඉපදෙන සතර බීජාක්ෂර නම් කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk